# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1979 අංක 34 දරන
# ඛනිජ තෙල් නිෂ්පාදන (සැපයුම් විධිමත් කිරීමේ හා පාලනය කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1979 මැයි මස 31 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1979 ජූනි මස 08 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ: රු. 1.65 යි    තැපැල් ගාස්තුව: ශත 50 යි

# 1979 අංක 34 දරන ඛනිජ තෙල් නිෂ්පාදන (සැපයුම් විධිමත් කිරීමේ හා පාලනය කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1979 මැයි මස 31 වන දින]

එල්. ඩී.—ඕ. 15/79

**ඛනිජ තෙල් නිෂ්පාදන සාධාරණ ලෙස බෙදා හැරීම සහතික කිරීමේ සහ ඒවායේ සැපයුම් සංරක්ෂණය කිරීමේ අදහසින් ඒ නිෂ්පාදන බෙදා හැරීම සහ පාවිච්චි කිරීම විධිමත් කිරීම හා පාලනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දින.**

**1.** (1) මේ පනත 1979 අංක 34 දරන ඛනිජ තෙල් නිෂ්පාදන (සැපයුම් විධිමත් කිරීමේ හා පාලනය කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) මේ පනතෙහි විධිවිධාන පහත දැක්වෙන පරිදි ක්‍රියාත්මක විය යුතු ය:—

(අ) මේ පනතේ මේ වගන්තියෙහි විධිවිධාන සහ I වන සහ IX වන කොටස්වල විධිවිධාන මේ පනත පනවනු ලබන දින යෙහි ක්‍රියාත්මක විය යුතු ය;

(ආ) මේ පනතේ II වන, III වන, IV වන, V වන, VI වන, VII වන සහ VIII වන කොටස්වල විධිවිධාන, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක හෝ දිනවල ක්‍රියාත්මක විය යුතු ය. මේ පනතේ විවිධ කොටස් වෙනුවෙන් විවිධ දිනයන් නියම කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ කරනු ලබන නියමයකින් මේ පනතේ යම් කොටසක් ක්‍රියාත්මක කරනු ලැබූ අවස්ථාවක, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන සමාන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් එම නියමය ප්‍රත්‍යාදිෂ්ට කරනු ලබන තුරු, ඒ කොටසේ විධිවිධාන ක්‍රියාත්මකව පැවතිය යුතු ය.

(4) මේ පනතේ කිසියම් කොටසක් ක්‍රියාත්මක කරමින් (2) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ කරන ලද නියමයක් ප්‍රත්‍යාදිෂ්ට කිරීම, ඒ ප්‍රත්‍යාදිෂ්ට කිරීමෙන් පසු යම් අවස්ථාවක දී ඒ ඡේදය යටතේ කරනු ලබන තදනන්තර නියමයක් මගින් එම කොටස ක්‍රියාත්මක කිරීමට අමාත්‍යවරයාට ඇති බලය කෙරෙහි හානිකර ලෙස බලපාන්නේ යයි සලකනු නොලැබිය යුතු ය.

## I වන කොටස

## පරිපාලනය

**නිලධරයන් සහ සේවකයන් පත් කිරීම.**

**2.** (1) මේ පනතේ කාර්ය සඳහා—

(අ) නමින් හෝ නිලයෙන් (මේ පනතෙහි "බලධරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) ඛනිජ තෙල් නිෂ්පාදන පිළිබඳ නිසි බලධරයකු ද පනතෙහි විධිවිධාන ක්‍රියාත්මක

කිරීමේ හෝ බලගැන්වීමේ කාර්යය සඳහා අවශ්‍ය වන ඛනිජ තෙල් පාලකයන්, නියෝජ්‍ය ඛනිජ තෙල් පාලකයන් සහ සහකාර ඛනිජ තෙල් පාලකයන් යම් සංඛ්‍යාවක් ද ;

(ආ) මේ පනත ක්‍රියාත්මක කිරීමෙහි ලා (අ) ඡේදයෙහි සඳහන් නිලධරයන්ට සහාය වීම පිණිස අවශ්‍ය වන වෙනත් නිලධරයන් සහ සේවකයන් ද

පත් කරනු ලැබිය හැකි ය.

(2) මේ පනතින් බලධරයා වෙත පවරන ලද, නියම කරන ලද හෝ භාර කරන ලද යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් බලධරයා විසින් යම් ඛනිජ තෙල් පාලකයකු, නියෝජ්‍ය ඛනිජ තෙල් පාලකයකු නැතහොත් සහකාර ඛනිජ තෙල් පාලකයකු වෙත ලියවිල්ලකින් පවරනු ලැබිය හැකි ය.

## II වන කොටස

## පෙට්රල් විකිණීම ආදිය සීමා කිරීම

පෙට්රල් මිලට ගැනීම සීමා කිරීම.

3. මේ පනතේ මේ කොටස ක්‍රියාත්මකවීම ආරම්භ වූ දිනයෙහි සිට සහ ඉන් පසුව, විකුණුම්කරුවකු නොවන කිසිම තැනැත්තකු විසින්, ඔහු අනුමත පෙට්රල් පාරිභෝගිකයකු ද බලධරයා විසින් පෙට්රල් සම්බන්ධයෙන් නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් දරන්නකු ද වන්නේ නම් මිස, පෙට්රල් මිලට ගැනීම හෝ ලබා ගැනීම නොකළ යුතු ය.

ඇතැම් තැනැත්තන් පෙට්රල් පාරිභෝගිකයන් වශයෙන් අනුමත කර ඇති ලෙස සලකනු ලැබිය යුතු බව.

4. (1) පෙට්රල්වලින් ධාවනය කරවනු ලබන මෝටර් වාහනයක අයිතිකරු ලෙස මෝටර් වාහන පනත යටතේ ලියාපදිංචි වූ ද, ඒ වාහනය වෙනුවෙන් ඒ පනත යටතේ ලියාපදිංචි කරන ලද—

(අ) ලියාපදිංචි කිරීමේ සහතිකයක් ;

(ආ) වලංගු ආදායම් බලපත්‍රයක් ; සහ

(ඇ) වලංගු රක්ෂණ සහතිකයක්

දරන්නා වූ ද සෑම තැනැත්තකු ම, ඔහු එසේ ලියාපදිංචිව සිටින තාක් සහ සිටින තාක් පමණක් පෙට්රල් පාරිභෝගිකයකු ලෙස බලධරයා විසින් මේ පනත යටතේ අනුමත කරනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන ප්‍රකාර, පෙට්රල් පාරිභෝගිකයකු වශයෙන් මේ පනත යටතේ අනුමත කරනු ලැබ ඇතැයි සලකනු ලබන යම් තැනැත්තකුට යම් කාල සීමාවක් තුළ දී ලබා ගැනීමට බලය දිය යුතු පෙට්රල් ප්‍රමාණය තීරණය කිරීමට බලධරයාට හැකිවීම පිණිස, බලධරයාට අවශ්‍ය වන තොරතුරු සපයන ලෙස බලධරයා විසින් ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකිය.

(3) මේ පනත යටතේ පෙට්‍රල් පාරිභෝගිකයකු වශයෙන් මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන ප්‍රකාර අනුමත කරනු ලැබ ඇතැයි සලකනු ලබන යම් තැනැත්තකුට පෙට්‍රල් පාරිභෝගිකයකු වශයෙන් අනුමතය සඳහා 5 වන වගන්තිය යටතේ ඉල්ලුම් කිරීමට නියම කරනු ලැබේ යයි මේ පනතෙහි වූ කිසිවක් තේරුම් ගැනීම හෝ අර්ථ නිරූපණය කිරීම හෝ නොකළ යුතු ය.

5. (1) යම් තැනැත්තකු පෙට්‍රල් පාරිභෝගිකයකු ලෙස අනුමත කරනු ලැබීම සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක් ම බලධරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර— පෙට්‍රල් පාරිභෝගිකයකු ලෙස අනුමත කරනු ලැබීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය.

(අ) ඒ තැනැත්තාට පෙට්‍රල් අවශ්‍ය වන්නේ යම් වාහනයක්, යාත්‍රාවක්, ගුවන් යානයක්, පිරියතක් නැතහොත් යන්ත්‍රයක් සඳහා ද ඒ වාහනය, යාත්‍රාව, ගුවන් යානය, පිරියත නැතහොත් යන්ත්‍රය පිළිබඳ විස්තරයක් සහ වාහනයක් සම්බන්ධයෙන් වූ විට එහි ලියාපදිංචි අංකය, නිෂ්පාදන වර්ගය සහ අශ්ව බලය ද;

(ආ) ඒ වාහනය, යාත්‍රාව, ගුවන් යානය, පිරියත නැතහොත් යන්ත්‍රය උපයෝගී කර ගැනීමට අදහස් කරනු ලබන්නේ යම් කාර්යයක් සඳහා ද ඒ කාර්යය ද;

(ඇ) එම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරනු ලබන්නේ යම් දිනයක ද ඒ දිනයට ඉහතින් ම වූ මාස දොළහ ඇතුළත ඉල්ලුම්කරු විසින් මිලට ගන්නා ලද පෙට්‍රල්වල සාමාන්‍ය මාසික ප්‍රමාණය ද;

(ඈ) ඒ දිනයෙන් පසුව ඉල්ලුම්කරුට අවශ්‍ය වන පෙට්‍රල්වල ඇස්තමේන්තු කරන ලද සාමාන්‍ය මාසික ප්‍රමාණය ද;

(ඉ) නියම කරනු ලබන වෙනත් යම් කාරණා පිළිබඳ විස්තර ද

එහි දක්වා තිබිය යුතු ය.

(2) වාහනයක, යාත්‍රාවක, නැතහොත් ගුවන් යානාවක ටැන්කියෙහි නොව අන්‍යාකාරයකින් පෙට්‍රල් කිසිවක් භාර ගැනීමට අදහස් කරන සෑම ඉල්ලුම්කරුවකු ම තමා ඒ පෙට්‍රල් භාර ගැනීමට අදහස් කරන ආකාරය ද ඒ ආකාරයට භාර ගැනීම අවශ්‍ය වීම සම්බන්ධයෙන් ස්වකීය හේතු ද තම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කළ යුතු ය.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා ඉල්ලුම් පත්‍ර ආකෘති, බලධරයා විසින් සපයනු ලැබිය හැකි අතර, එවැනි ආකෘති සපයනු ලබන අවස්ථාවක එසේ සපයන ලද ආකෘතියෙහි ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කළ යුතු ය.

සමහර තැනැත්තකු පෙට්‍රල් පාරිභෝගිකයකු ලෙස අනුමත කිරීම ප්‍රතික්ෂේප කිරීමට බලධරයාට ඇති බලය.

6. (1) (අ) පෙට්‍රල්වල ශ්‍රී ලංකාවෙහි ඇති තොග;

(ආ) මහජන කාර්ය සඳහා සහ අත්‍යවශ්‍ය සේවා පවත්වා ගෙන යාම සඳහා පාවිච්චි කිරීම පිණිස ඒ තොග සංරක්ෂණය කිරීමේ අවශ්‍යතාව; සහ

(ඇ) යම් තැනැත්තකුට පෙට්‍රල් අවශ්‍ය වන කාර්යය ගැන සලකන කල්හි, එම පෙට්‍රල් සැපයුම් ලබා ගැනීමට ඒ තැනැත්තාට අවසර නොදිය යුතු බවට බලධරයා සෑහීමට පත් වන්නේ නම්, බලධරයා විසින් ඒ තැනැත්තා පාරිභෝගිකයකු ලෙස අනුමත කිරීම ප්‍රතික්ෂේප කළ හැකි ය.

(2) පෙට්‍රල් පාරිභෝගිකයකු ලෙස යම් තැනැත්තකු අනුමත කිරීම බලධරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක—

(අ) ඒ තැනැත්තා විසින් ස්වකීය ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කොට ඇති ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් ඔහු වෙත යවනු ලබන ලිපියක් මගින් ඒ ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව බලධරයා විසින් දැනුම් දිය යුතු ය;

(ආ) ඒ දැන්වීම ලැබීමෙන් සති දෙකක් ඇතුළත ඒ තැනැත්තා විසින් ඒ ප්‍රතික්ෂේප කිරීමට විරුද්ධව අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද යම් අභියාචනයක් සම්බන්ධයෙන් එම ලේකම්වරයාගේ තීරණය අවසානාත්මක විය යුතු ය.

අනුමත පාරිභෝගිකයන්ට බලපත්‍ර නිකුත් කිරීම.

7. (1) පෙට්‍රල් පාරිභෝගිකයකු ලෙස යම් තැනැත්තකු අනුමත කරනු ලැබූ හෝ අනුමත කරනු ලැබ ඇතැයි සලකනු ලබන අවස්ථාවක, බලධරයා විසින් කලින් කල—

(අ) එවකට ශ්‍රී ලංකාවෙහි තිබෙන පෙට්‍රල්වල තොග;

(ආ) මහජන කාර්ය සඳහා සහ අත්‍යවශ්‍ය සේවා පවත්වා ගෙන යාම සඳහා පාවිච්චි කිරීම පිණිස ඒ තොග සංරක්ෂණය කිරීමේ අවශ්‍යතාව; සහ

(ඇ) ඒ තැනැත්තාට පෙට්‍රල් අවශ්‍ය වන කාර්යය

ගැන සැලකිලිමත්ව යම් කාලසීමාවක් තුළ දී ඒ තැනැත්තාට ලබා ගැනීමට බලය දිය හැකි ඒ නිෂ්පාදනයේ ප්‍රමාණය තීරණය කළ හැකි අතර බලපත්‍ර එකක් හෝ වැඩි ගණනක් ඒ තැනැත්තා වෙත නිකුත් කරනු ලැබිය හැකි ය. තව ද ඒ කාලසීමාව තුළ පෙට්‍රල්වල එම ප්‍රමාණය ඔහුට ලබා ගැනීමට හැකි වීම පිණිස අවශ්‍ය වන යම් කූපන් සංඛ්‍යාවක් ඊට යාකළ යුතු ය.

(2) යම් කාලසීමාවක් තුළ දී අනුමත පාරිභෝගිකයකුට ලබා ගැනීමට බලය දියහැකි පෙට්‍රල් ප්‍රමාණය බලධරයා විසින් (1) වන උපවගන්තිය යටතේ තීරණය කරනු ලබන අවස්ථාවක, (1) වන

උපවගන්තියේ (අ), (ආ) සහ (ඇ) ඡේදවල දක්වා ඇති කාරණා පිළිබඳව සැලකිලිමත්ව ඔහු විසින් ඒ තීරණය ඒ කාලසීමාව තුළ යම් අවස්ථාවක දී වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක් සහ එවැනි යම් බලපත්‍රයකට යාකරන ලද කූපනයක් නිකුත් කරන ලද්දේ යම් කාලසීමාවක් වෙනුවෙන් ද ඒ කාලසීමාව තුළ දී මිස, ඒ බලපත්‍රය හෝ කූපනය වලංගු නොවිය යුතු ය.

(4) සිල්ලර ගබඩාවක් නොවන යම් ස්ථානයක දී පෙට්‍රල් කිසිවක් මිලට ගැනීමට හෝ ලබා ගැනීමට යම් තැනැත්තකුට කිසිම බලපත්‍රයකින් බලය දෙනු නොලැබිය යුතු ය :

එසේ වුව ද පෙට්‍රල් පාරිභෝගිකයකු වෙත නිකුත් කරනු ලබන බලපත්‍රයක කරනු ලබන සටහනක් මගින් එම පෙට්‍රල් කෙළින්ම සංස්ථාවෙන් මිලට ගැනීමට හෝ ලබා ගැනීමට බලධරයා විසින් ඒ පාරිභෝගිකයාට බලය දෙනු ලැබිය හැකි ය.

8. අනුමත පෙට්‍රල් පාරිභෝගිකයකු විසින්— බලපත්‍ර ආදිය විකිණීම සහ පැවරීම තහනම් කිරීම.

(අ) ඒ පාරිභෝගිකයා වෙත නිකුත් කරන ලද යම් බලපත්‍රයක් හෝ එවැනි යම් බලපත්‍රයකට යා කරන ලද යම් කූපනයක් වෙනත් යම් තැනැත්තකුට විකිණීම නැතහොත් පැවරීම ; හෝ

(ආ) ඒ පාරිභෝගිකයාගේ පාවිච්චිය සඳහා පෙට්‍රල් මිලට ගැනීමට හෝ ලබා ගැනීමට වෙනත් යම් තැනැත්තකුට හැකි කිරීමේ කාර්යය සඳහා හැර ඒ වෙනත් තැනැත්තාට ඒ බලපත්‍රය හෝ කූපනය භාරදීම ; හෝ

(ඇ) කූපනය යාකර ඇත්තේ යම් බලපත්‍රයකට ද ඒ බලපත්‍රයෙහි නියමවලට අනුකූලව, විකුණුම්කරුගෙන් හෝ සංස්ථාවෙන් පෙට්‍රල් මිලට ගැනීමේ හෝ ලබා ගැනීමේ කාර්යය සඳහා හැර එවැනි යම් කූපනයක් විකුණුම්කරුවකුට හෝ සංස්ථාවට භාර දීම ; හෝ

(ඈ) ඒ පාරිභෝගිකයා වෙත නිකුත් කරන බලපත්‍රයක බලය යටතේ මිලට ගන්නා ලද හෝ ලබා ගන්නා ලද පෙට්‍රල් කිසිවක් වෙනත් යම් තැනැත්තකුට විකිණීම නැතහොත් භාරදීම ; හෝ

නොකළ යුතු ය.

9. (1) පෙට්‍රල් පාරිභෝගිකයකු ලෙස යම් තැනැත්තකු මේ පනත යටතේ අනුමත කරනු ලැබූ හෝ අනුමත කරනු ලැබ ඇතැයි සලකනු ලබන හෝ අවස්ථාවක— පෙට්‍රල් පාරිභෝගිකයකු ලෙස අනුමත කිරීම ප්‍රත්‍යාදිෂ්ට කිරීම.

(අ) ඒ තැනැත්තා මේ පනතේ විධිවිධාන කිසිවක් කඩකර ඇති බවට හෝ මේ පනත යටතේ බලධරයා විසින් නිකුත් කරන ලද හෝ දෙන ලද විධාන කිසිවක් අනුව ක්‍රියා කිරීම පැහැර හැර ඇති බවට හෝ ඒ යටතේ සාදන ලද හෝ

සපයන ලද යම් ඉල්ලුම් පත්‍රයක හෝ වාර වාර්තාවක දැන දැනම අසත්‍ය ප්‍රකාශයක් කර ඇති බවට හෝ බලධරයා සෑහීමට පත් වන්නේ නම්; හෝ

(ආ) (i) එවකට ශ්‍රී ලංකාවෙහි තිබෙන පෙට්‍රල් තොග;

(ii) මහජන කාර්ය සඳහා සහ අත්‍යවශ්‍ය සැපයුම් පවත්වාගෙන යාම සඳහා පාවිච්චි කිරීම පිණිස ඒ තොග සංරක්ෂණය කිරීමේ අවශ්‍යතාව; සහ

(iii) ඒ තැනැත්තාට පෙට්‍රල් අවශ්‍ය වන කාර්යය

ගැන සලකන කල්හි ඒ පෙට්‍රල් සැපයුම් ලබා ගැනීමට ඒ තැනැත්තාට අවසර නොදිය යුතු බවට බලධරයා සෑහීමට පත් වන්නේ නම්

බලධරයා විසින් ඒ අනුමතය ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකි ය.

(2) පෙට්‍රල් පාරිභෝගිකයකු ලෙස යම් තැනැත්තකු අනුමත කරනු ලැබීම බලධරයා විසින් (1) වන උපවගන්තිය යටතේ ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ අවස්ථාවක—

(අ) පාරිභෝගිකයකු ලෙස අනුමත කරනු ලැබීම සඳහා වූ ස්වකීය ඉල්ලුම් පත්‍රයෙහි ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට හෝ මෝටර් වාහනයක ලියාපදිංචි අයිතිකරුවකුව සිටීමේ හේතුවෙන් පෙට්‍රල් පාරිභෝගිකයකු ලෙස අනුමත කරනු ලැබ ඇතැයි සලකනු ලබන තැනැත්තකු සම්බන්ධයෙන් වූ විට ඒ වාහනය වෙනුවෙන් මෝටර් වාහන පනත යටතේ නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකයෙහි සඳහන් ලිපිනයට හෝ ඒ තැනැත්තා වෙත ලියාපදිංචි තැපැලෙන් යවනු ලබන ලිපියක් මඟින් ඒ ප්‍රත්‍යාදිෂ්ට කිරීම පිළිබඳව බලධරයා විසින් දැනුම් දිය යුතු ය;

(ආ) ඒ තැනැත්තා විසින් ඒ දැන්වීම ලැබීමෙන් සති දෙකක් ඇතුළත සහ රුපියල් පහක ගාස්තුවක් ගෙවීමෙන් ඒ ප්‍රත්‍යාදිෂ්ට කිරීමට විරුද්ධව අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත, අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ කරනු ලබන යම් අභියාචනයක් සම්බන්ධයෙන්, ලේකම්වරයාගේ තීරණය අවසානාත්මක විය යුතු ය.

(4) පෙට්‍රල් පාරිභෝගිකයකු ලෙස යම් තැනැත්තකු අනුමත කරනු ලැබීම (1) වන උපවගන්තිය යටතේ බලධරයා විසින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ අවස්ථාවක හෝ යම් තැනැත්තකු අනුමත පෙට්‍රල් පාරිභෝගිකයකුව සිටීම නතර වන අවස්ථාවක හෝ 7 වන වගන්තිය යටතේ බලධරයා විසින් ඔහු වෙත නිකුත් කරනු ලැබූ සෑම බලපත්‍රයක් ම ඒ තැනැත්තා විසින් බලධරයා වෙත ආපසු භාරදිය යුතු ය.

10. (1) මේ පනතේ මේ කොටසෙහි විධිවිධාන ක්‍රියාත්මක වූ දිනයෙහි සහ ඒ දිනයෙන් පසුව කිසිම තැනැත්තකු විසින් පෙට්‍රල් යම් ප්‍රමාණයක් වෙනත් යම් තැනැත්තකුට විකිණීම හෝ භාර දීම— පෙට්‍රල් විකිණීම හෝ භාරදීම පිළිබඳ විධිවිධාන.

(අ) ඒ විකිණීම හෝ භාරදීම සිල්ලර ගබඩාවක දී හෝ සංස්ථාවේ දී සිදුවන්නේ නම් සහ ඒ වෙනත් තැනැත්තා විසින් ඒ සිල්ලර ගබඩාවට අදාළ විකුණුම්කරුට නැතහොත් සංස්ථාවෙහි අනුයෝජිතයකුට හෝ සේවකයකුට වලංගු බලපත්‍රයක් ඉදිරිපත් කරන්නේ නම් මිස; සහ

(ආ) ඒ නිෂ්පාදනයේ ඒ ප්‍රමාණය නියෝජනය කරන වලංගු කූපනයක් හෝ වලංගු කූපන් ඒ විකුණුම්කරු විසින් නැතහොත් ඒ අනුයෝජිතයා හෝ සේවකයා විසින් හෝ ඒ බලපත්‍රයෙන් වෙන් කර ගනු ලබන්නේ නම් මිස

නොකළ යුතු ය.

සංස්ථාව විසින් හෝ සංස්ථාවේ බලයලත් අනුයෝජිතයකු විසින් හෝ විකුණුම්කරුවකුට පෙට්‍රල් විකිණීම හෝ භාරදීම සම්බන්ධයෙන් මේ උපවගන්තියෙහි සඳහන් කිසිවක් අදාළ නොවිය යුතු ය.

(2) පෙට්‍රල් කිසිවක් මිලට ගැනීමට හෝ ලබා ගැනීමට (මේ උපවගන්තියෙහි "මිලට ගැනුම්කරු" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් තැනැත්තකුට බලය දෙන බලපත්‍රයක් ඒ මිලට ගැනුම්කරු විසින් සිල්ලර ගබඩාවක වැඩ කරන තැනැත්තකු වෙත ඉදිරිපත් කරන්නා වූ ද මෝටර් වාහනයක කාර්ය සඳහා ඒ පෙට්‍රල් මිලට ගැනීමට හෝ ලබා ගැනීමට ඒ මිලට ගැනුම්කරුට බලය දී ඇති බවට සටහනක් ඒ බලපත්‍රයෙහි තිබෙන්නා වූ ද අවස්ථාවක, එම සිල්ලර ගබඩාවෙහි වැඩ කරන තැනැත්තා විසින්—

(අ) මේ උපවගන්තියේ (ආ) ඡේදයෙහි සඳහන් අවස්ථාවේ දී හැර, වාහනයක ටැන්කිය තුළට සැපයීම නොවන වෙනත් ආකාරයකින් මිලට ගැනුම්කරු වෙත ඒ පෙට්‍රල් භාරදීම නොකළ යුතු ය;

(ආ) මිලට ගැනුම්කරුට අවශ්‍ය ආකාරයකට ඒ පෙට්‍රල් භාර දීමට මිලට ගැනුම්කරු විසින් ඉදිරිපත් කරන ලද බලපත්‍රයෙහි බලය දී ඇත්නම්, වාහනයක ටැන්කිය තුළට සැපයීම නොවන වෙනත් ආකාරයකින් ඒ පෙට්‍රල් භාර දෙන ලෙස මිලට ගැනුම්කරු ඉල්ලා සිටි විට එසේ භාර දීම කළ යුතු ය; තව ද

(ඇ) මේ උපවගන්තියේ (ආ) ඡේදයෙහි සඳහන් අවස්ථාවේ දී හැර, මෝටර් වාහන පනත යටතේ වාහනය ලියාපදිංචි කළ විට එයට පවරන ලද (මේ පනතෙහි ඇතැම් විට ලියාපදිංචි අංකය යනුවෙන් සඳහන් කරනු ලබන) හඳුනා ගැනීමේ අංකය වශයෙන්, මිලට ගැනුම්කරුට ඒ පෙට්‍රල් මිලට ගැනීමට හෝ ලබා ගැනීමට බලය දී ඇත්තේ යම්

වාහනයක කාර්ය සඳහා ද ඒ වාහනයෙහි අංකය ලෙස මිලට ගැනුම්කරු විසින් ඉදිරිපත් කරනු ලබන බලපත්‍රයෙහි සඳහන් අංකය දරන වාහනයේ ටැංකියට දැමීමෙන් හෝ වත්කිරීමෙන් ඒ පෙට්‍රල් ඒ මිලට ගැනුම්කරුට භාර දීම කළ යුතු ය:

එසේ වුව ද මේ විධිවිධාන මගින් නියම කර ඇති ආකාරය නොවන වෙනත් ආකාරයකට ඒ පෙට්‍රල් භාරදීමට බලපත්‍රයෙන් බලය දී ඇත්නම් එසේ භාර දීම, මේ උපවගන්තියේ (ඇ) ඡේදයේ විධිවිධාන කිසිවකින් වළක්වනු ලබනැයි සලකනු නොලැබිය යුතු ය.

(3) යම් සිල්ලර ගබඩාවක යම් වේලාවක දී, ඒ වේලාවේ ඒ ගබඩාවෙහි විකුණුම්කරු නොවන යම් තැනැත්තකු විසින් පෙට්‍රල් කිසිවක් මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන අතුරින් කිසිවක් කඩකරමින් වෙනත් යම් තැනැත්තකුට විකුණන්නා වූ හෝ භාර දෙන්නා වූ අවස්ථාවක ඒ කඩ කිරීම සංයුක්ත වන වරද සම්බන්ධ යෙන් ඒ විකුණුම්කරු ද වරදකරු විය යුතු ය.

(4) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන පෙට්‍රල් කිසිවක් වෙනත් යම් තැනැත්තකුට විකිණීම හෝ වෙනත් යම් තැනැත්ත කුට අයත් යම් වාහනයක ටැංකිය තුළට දැමීමෙන් හෝ වත්කිරී මෙන් භාරදීම හෝ සම්බන්ධයෙන් අදාළ වන ආකාරයෙන් ම, ඒ විධිවිධාන, යම් සිල්ලර ගබඩාවක දී පෙට්‍රල් කිසිවක් ඒ ගබඩා වෙහි විකුණුම්කරුට විකිණීම හෝ ඒ විකුණුම්කරුට අයත් යම් වාහනයක ටැන්කිය තුළට දැමීමෙන් හෝ වත්කිරීමෙන් භාරදීම හෝ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

සිල්ලර ගබඩාවල තොග අඩුවීම හෝ වැඩිවීම.

11. (1) මේ පනතේ මේ කොටස ක්‍රියාත්මක වන දිනයෙහි සහ ඒ දිනයෙන් පසුව—

(අ) මේ උපවගන්තියෙහි "අදාළ දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන යම් දිනයක දී සිල්ලර ගබඩාවක ඇති පෙට්‍රල් තොගයේ ප්‍රමාණයෙහි ; සහ

(ආ) ඒ ගබඩාවෙහි පෙට්‍රල් තොග බලධරයා විසින් අවසන් වරට නිසැකව දැන ගන්නා ලද දිනය හා අදාළ දිනය අතර ඒ ගබඩාවට භාර දී ඇති, බලධරයා විසින් නිකුත් කරන ලද, කූපන් මගින් නියෝජනය කරන ලද- ඒ පෙට්‍රල්වල ප්‍රමාණයෙහි

එකතුව—

(i) බලධරයා විසින් ඒ ගබඩාවෙහි ඒ පෙට්‍රල්වල තොග අවසන් වරට නිසැකව දැන ගන්නා ලද දිනයෙහි ඒ ගබඩාවෙහි තිබුණ ඒ පෙට්‍රල් තොගයේ ප්‍රමාණ යෙහි ; සහ

(ii) බලධරයා ඒ ගබඩාවෙහි ඒ පෙට්‍රල්වල තොග අවසන්වරට නිසැකව දැනගන්නා ලද දිනය හා අදාළ දිනය අතර සංස්ථාව විසින් හෝ සංස්ථාවෙහි

යම් බලය ලත් වෙළෙන්දකු විසින් හෝ ඒ ගබඩා වට පෙට්‍රල් යම් ප්‍රමාණයක් සපයන ලද නම්, ඒ ප්‍රමාණයෙහි

එකතුවට අඩුවන අවස්ථාවක, ඒ පෙට්‍රල් 10 වන වගන්තියේ (1) වන උපවගන්තිය කඩ කරමින් ඒ ගබඩාවෙහි විකුණා ඇතැයි සලකනු ලැබිය යුතු අතර, ඒ පෙට්‍රල් තොගයෙහි අඩුව කිසියම් නොවැළැක්විය හැකි හේතුවක් නිසා සිදුවී ඇති බව අධිකරණය සෑහීමට පත් වන පරිදි ඒ ගබඩාවෙහි විකුණුම්කරු විසින් ඔප්පු කරනු ලැබුවහොත් මිස, ඒ කඩ කිරීම සංයුක්ත වන වරද සම්බන්ධයෙන් ඔහු වරදකරු විය යුතු ය.

(2) මේ පනතේ මේ කොටස ක්‍රියාත්මකවීම ආරම්භ වූ දින සිට සහ ඉන් පසුව—

(අ) මේ උපවගන්තියෙහි "අදාළ දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන යම් දිනයක දී සිල්ලර ගබඩාවක ඇති පෙට්‍රල් තොගයේ ප්‍රමාණයෙහි ; සහ

(ආ) බලධරයා විසින් ඒ ගබඩාවෙහි ඒ පෙට්‍රල් තොග අවසන් වරට නිසැකව දැනගන්නා ලද දිනය හා අදාළ දිනය අතර ඒ ගබඩාවට භාරදී ඇති, බලධරයා විසින් නිකුත් කරන ලද, කූපන් මගින් නියෝජනය කරන ලද ඒ පෙට්‍රල් ප්‍රමාණයෙහි

එකතුව—

(i) බලධරයා විසින් ඒ ගබඩාවෙහි ඒ පෙට්‍රල් තොග, අවසන් වරට නිසැකව දැනගන්නා ලද දිනයෙහි ඒ ගබඩාවෙහි තිබුණ ඒ පෙට්‍රල් තොගයේ ප්‍රමාණයෙහි ; සහ

(ii) බලධරයා විසින් ඒ ගබඩාවෙහි ඒ පෙට්‍රල් තොග අවසන් වරට නිසැකව දැනගන්නා ලද දිනය හා අදාළ දිනය අතර සංස්ථාව විසින් හෝ සංස්ථාවෙහි යම් බලයලත් වෙළෙන්දකු විසින් හෝ ඒ ගබඩාවට පෙට්‍රල් යම් ප්‍රමාණයක් සපයන ලද නම්, ඒ ප්‍රමාණයෙහි

එකතුවට වැඩි වන්නා වූ අවස්ථාවක, ඒ පෙට්‍රල් තොගයෙහි අධි ප්‍රමාණය නොවැළැක්විය හැකි හේතුවක් නිසා සිදුවූ බව හෝ නීත්‍යානුකූල මාර්ගවලින් ලබාගත් බව හෝ අධිකරණය සෑහීමට පත්වන පරිදි ඒ ගබඩාවෙහි විකුණුම්කරු විසින් ඔප්පු කරනු ලැබුවහොත් මිස, ඔහු වරදක් සම්බන්ධයෙන් වරදකරු වන්නේ ය.

**12.** මේ පනතේ මේ කොටස ක්‍රියාත්මක වීම ආරම්භ වූ දින සිට සහ ඉන් පසුව සෑම විකුණුම්කරුවකු විසින් ම පෙට්‍රල් විකුණූ විට හෝ භාර දුන් විට, 10 වන වගන්තිය යටතේ තමා වෙත භාර දෙන ලද කූපන් සියල්ල ම, බලධරයා විසින් නිකුත් කරනු ලබන විධාන වලට අනුකූලව බලධරයා විසින් ඒ විධානවල සඳහන් කර ඇති යම් නිලධරයකු වෙත හෝ සංස්ථාව වෙත හෝ කලින් කල යැවිය යුතු ය. පෙට්‍රල් විකිණීමක් කළ විට විකුණුම් කරුගේ කාර්ය.

විකුණුම්කරුවක් නොවන වෙනත් තැනැත්තන් විසින් සැපයිය යුතු වාර්තා.

13. මේ පනතේ මේ කොටස ක්‍රියාත්මක වීම ආරම්භ වූ දින සිට සහ ඉන් පසුව වාහනයක, යාත්‍රාවක හෝ ගුවන් යානයක, ටැන්කියෙහි නොව වෙනත් ආකාරයකින්, පෙට්‍රල් ගැලුම් දහයකට වැඩි යම් ප්‍රමාණයක් ඒ දිනයෙහි තම සන්තකයෙහි ඇති, විකුණුම්කරුවකු නැතහොත් සංස්ථාව නොවන සෑම තැනැත්තකු ම, ඒ දිනයෙහි සිට සති දෙකක කාලසීමාවක් ඉකුත් වීමට පෙර, තම සන්තකයෙහි ඇති පෙට්‍රල් ප්‍රමාණය සඳහන් කරමින් බලධරයා වෙත වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය. තව ද පෙට්‍රල් පාරිභෝගිකයකු වශයෙන් ඒ තැනැත්තා මේ පනත යටතේ අනුමත කරනු ලැබ සිටිය ද නැතහොත් අනුමත කර ඇතැයි සලකනු ලැබුව ද ඒ නොතකා, එසේ සඳහන් කරන ලද පෙට්‍රල් ප්‍රමාණය ඒ තැනැත්තාට පෙට්‍රල් අවශ්‍ය වන කාර්යය සඳහා යම් කාල සීමාවකට ප්‍රමාණවත් යයි බලධරයා අදහස් කරන්නේ ද ඒ කාල සීමාව වෙනුවෙන් ඔහුට යම් බලපත්‍රයක් නිකුත් කිරීම බලධරයා විසින් ප්‍රතික්ෂේප කළ හැකි ය.

සංස්ථාව විසින් ඛනිජ තෙල් නිෂ්පාදන විකිණීම යනාදිය සම්බන්ධයෙන් සීමා කිරීම.

14. මේ පනතේ මේ කොටස ක්‍රියාත්මක වීම ආරම්භ වූ දින සිට සහ ඉන් පසුව—

(1) යම් විකුණුම්කරුවකුට විකුණනු ලැබිය හැකි නැතහොත් භාර දෙනු ලැබිය හැකි පෙට්‍රල් ප්‍රමාණය සහ ඒ භාර දීම කළ හැකි වේලාව පිළිබඳව බලධරයා විසින් කලින් කල නිකුත් කරනු ලබන විධිවිධානවලට අනුකූලව මිස, සංස්ථාව විසින් ඒ විකුණුම්කරුට පෙට්‍රල් විකිණීම හෝ භාරදීම නොකළ යුතු ය.

(2) යම් පෙට්‍රල් ප්‍රමාණයක් කෙළින්ම සංස්ථාවෙන් මිලට ගැනීමට හෝ ලබා ගැනීමට විකුණුම්කරුවකු නොවන යම් තැනැත්තකුට බලය දෙන සටහනක් දරන වලංගු බලපත්‍රයක්, ඒ තැනැත්තා විසින් හෝ ඒ තැනැත්තා වෙනුවෙන් ඉදිරිපත් කරනු ලබන විටක දී හැර, විකුණුම්කරුවකු නොවන යම් තැනැත්තකු වෙත පෙට්‍රල් කවර ප්‍රමාණයක් හෝ විකිණීම හෝ භාර දීම සංස්ථාව විසින් නොකළ යුතු ය.

සන්තකය දැරීම, සෝදිසි කිරීමේ බලය යනාදිය සීමා කිරීම.

15. (1) මේ පනතේ මේ කොටස ක්‍රියාත්මක වීම ආරම්භ වූ දින සිට සහ ඉන් පසුව සංස්ථාව හෝ විකුණුම්කරුවකු නොවන කිසිම තැනැත්තකු විසින්—

(අ) ඒ තැනැත්තා අනුමත පෙට්‍රල් පාරිභෝගිකයකු නම්, මේ පනත යටතේ බලපත්‍රයක් නිකුත් කර ඇත්තේ යම් කාල සීමාවක් සඳහා ද ඒ කාලසීමාව වෙනුවෙන් ඒ බලපත්‍රයේ බලය යටතේ මිලට ගැනීමට හෝ ලබා ගැනීමට ඔහුට බලය ඇති ප්‍රමාණය ඉක්මවන යම් පෙට්‍රල් ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම හෝ තම සන්තකයෙහි තබා ගැනීම හෝ නොකළ යුතු ය; නැතහොත්

(ආ) ඒ තැනැත්තා අනුමත පෙට්‍රල් පාරිභෝගිකයකු නොවේ නම්, කිසිම පෙට්‍රල් ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම හෝ තම සන්තකයේ තබා ගැනීම හෝ නොකළ යුතු ය.

(2) බලය ලත් යම් නිලධරයකු විසින් පහත දැක්වෙන කාර්ය සිදු කිරීම; එනම්—

(අ) පෙට්‍රල් ගබඩා කර ඇත්තේ හෝ ගබඩා කර ඇතැයි සැක කරනු ලබන්නේ යම් ස්ථානයක ද වාහනයක ද යාත්‍රාවක ද නැතහොත් ගුවන් යානයක ද ඒ ස්ථානයෙහි, වාහනයෙහි, යාත්‍රාවෙහි නැතහොත් ගුවන් යානයෙහි ගබඩා කර ඇති පෙට්‍රල් ප්‍රමාණය නිසැකව දැන ගැනීමේ කාර්යය සඳහා ඒ ස්ථානයට, වාහනයට, යාත්‍රාවට නැතහොත් ගුවන් යානයට ඇතුල් වී, එය සෝදිසි කිරීම ද;

(ආ) යම් සිල්ලර ගබඩාවක ඇති මැනීමේ උපකරණයක් සාවද්‍ය ද යන වග නිසැකව දැන ගැනීමේ කාර්යය සඳහා ඒ උපකරණය පරීක්ෂා කිරීම සහ අත්හදා බැලීම ද

නීත්‍යානුකූල විය යුතු ය.

## III වන කොටස

### භූමිතෙල් විකිණීම ආදිය සීමා කිරීම

**16.** මේ පනතේ මේ කොටස ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට සහ ඉන් පසුව, විකුණුම්කරුවකු නොවන කිසිම තැනැත්තකු විසින්, ඔහු අනුමත භූමිතෙල් පාරිභෝගිකයකු ද බලධරයා විසින් භූමිතෙල් සම්බන්ධයෙන් නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් දරන්නකු ද වන්නේ නම් මිස, භූමිතෙල් මිලට ගැනීම හෝ ලබා ගැනීම නොකළ යුතු ය. *භූමිතෙල් මිලට ගැනීම සීමා කිරීම.*

**17.** (1) ගෘහ මූලික ලැයිස්තුවක තමාගේ නම ඇතුළත් කරනු ලැබ ඇත්තා වූ ද ප්‍රධාන ගෘහ මූලික ලෙස එහි නම් කර ඇත්තා වූ ද සෑම තැනැත්තකු ම, ඒ තැනැත්තා එසේ නම් කරනු ලැබ සිටින තාක් පහ ඒ තාක් පමණක්, භූමිතෙල් පාරිභෝගිකයකු වශයෙන් බලධරයා විසින් මේ පනත යටතේ අනුමත කරනු ලැබුවකු ලෙස සලකනු ලැබිය යුතු ය. *ඇතැම් තැනැත්තන් භූමිතෙල් පාරිභෝගිකයන් වශයෙන් අනුමත කර ඇති ලෙස සලකනු ලැබිය යුතු බව.*

මේ උපවගන්තියෙහි "ගෘහමූලික ලැයිස්තුව" යන්නෙන්, ආහාර පාලක විසින් පරිපාලනය කරනු ලබන සලාක ක්‍රමයේ කාර්ය සඳහා ඔහු විසින් පිළියෙල කොට පවත්වා ගෙන යනු ලබන ලැයිස්තුව අදහස් වේ.

(2) (1) වන උපවගන්තිය ප්‍රකාර, භූමිතෙල් පාරිභෝගිකයකු වශයෙන් අනුමත කරනු ලැබ ඇතැයි සැලකෙන යම් තැනැත්තකුට යම් කාල සීමාවක් තුළ දී ලබා ගැනීමට බලය දිය යුතු භූමිතෙල් ප්‍රමාණය තීරණය කිරීමට බලධරයාට හැකිවීම පිණිස, බලධරයාට අවශ්‍ය වන තොරතුරු සපයන ලෙස බලධරයා විසින් ඒ තැනැත්තාට නියම කළ හැකි ය.

(3) මේ පනත යටතේ භූමිතෙල් පාරිභෝගිකයකු වශයෙන් අනුමත කරනු ලැබ ඇතැයි (1) වන උපවගන්තිය ප්‍රකාර සැලකෙන යම් තැනැත්තකුට, භූමිතෙල් පාරිභෝගිකයකු වශයෙන් අනුමත

කිරීම සඳහා මේ පනත යටතේ ඉල්ලුම් කිරීමට නියම කරනු ලැබේ යයි මේ පනතේ වූ කිසිවක් තේරුම් ගැනීම හෝ අර්ථ නිරූපණය කිරීම නොකළ යුතු ය.

II වන කොටසේ ඇතැම් විධිවිධාන අදාළ වීම.

18. භූමිතෙල් පාරිභෝගිකයකු ලෙස අනුමත කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍ර, භූමිතෙල් පාරිභෝගිකයකු ලෙස තැනැත්තකු අනුමත කිරීම ප්‍රතික්ෂේප කිරීමට බලධරයාට ඇති බලය, අනුමත භූමිතෙල් පාරිභෝගිකයන්ට බලපත්‍ර නිකුත් කිරීම, අනුමත භූමිතෙල් පාරිභෝගිකයන්ට නිකුත් කරන ලද බලපත්‍ර විකිණීම සහ පැවරීම තහනම් කිරීම, භූමිතෙල් පාරිභෝගිකයකු වශයෙන් අනුමත කිරීම ප්‍රත්‍යාදිෂ්ට කිරීම, භූමිතෙල් විකිණීම සහ භාරදීම, සිල්ලර ගබඩාවල භූමිතෙල් තොග අඩුවෙන් තිබීම හෝ වැඩියෙන් තිබීම, භූමිතෙල් විකිණීමේ දී විකුණුම්කරුවන් සතු කාර්ය, සිය සන්තකයෙහි භූමිතෙල් තබා ගෙන ඇති තැනැත්තන් විසින් සපයනු ලැබිය යුතු වාර වාර්තා, සංස්ථාව විසින් භූමිතෙල් විකිණීම සීමා කිරීම, භූමිතෙල් සන්තකව සිටීම සීමා කිරීම සහ භූමිතෙල් පිළිබඳව සෝදිසි කිරීමේ බලතල යන කරුණු සම්බන්ධයෙන් 5 වන, 6 වන, 7 වන, 8 වන, 9 වන, 10 වන, 11 වන, 12 වන, 13 වන, 14 වන සහ 15 වන වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

## IV වන කොටස

### ඔටෝ ඩීසල් විකිණීම යනාදිය පිළිබඳ සීමා කිරීම්

ඔටෝ ඩීසල් මිලට ගැනීම පිළිබඳ සීමා කිරීම.

19. මේ පනතේ මේ කොටස ක්‍රියාත්මකවීම ආරම්භ වූ දිනයෙහි සිට සහ ඉන්පසුව, විකුණුම්කරුවකු නොවන කිසිම තැනැත්තකු විසින් ඔහු ඔටෝ ඩීසල් සම්බන්ධයෙන් අනුමත පාරිභෝගිකයකු ද ඔටෝ ඩීසල් වෙනුවෙන් බලධරයා විසින් නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් දරන්නකු ද වන්නේ නම් මිස, ඔටෝ ඩීසල් මිලට ගැනීම හෝ ලබා ගැනීම නොකළ යුතු ය.

ඇතැම් තැනැත්තන් ඔටෝ ඩීසල් පාරිභෝගිකයන් වශයෙන් අනුමත කර ඇති ලෙස සලකනු ලැබිය යුතු බව.

20. (1) ඩීසල්වලින් ධාවනය කරවනු ලබන මෝටර් වාහනයක අයිතිකරු ලෙස මෝටර් වාහන පනත යටතේ ලියාපදිංචි වූ ද, ඒ වාහනය වෙනුවෙන් ඒ පනත යටතේ නිකුත් කරන ලද

(අ) ලියාපදිංචි කිරීමේ සහතිකයක්;

(ආ) වලංගු ආදායම් බලපත්‍රයක්; සහ

(ඇ) වලංගු රක්ෂණ සහතිකයක්

දරන්නා වූ ද සෑම තැනැත්තකු ම, ඔහු එසේ ලියාපදිංචිව සිටින තාක් සහ සිටින තාක් පමණක් ඔටෝ ඩීසල් පාරිභෝගිකයකු ලෙස බලධරයා විසින් මේ පනත යටතේ අනුමත කරනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය ප්‍රකාර, ඔටෝ ඩීසල් පාරිභෝගිකයකු වශයෙන් මේ පනත යටතේ අනුමත කරනු ලැබ ඇතැයි සලකනු ලබන යම් තැනැත්තකුට යම් කාලසීමාවක් තුළ දී ලබා ගැනීමට

බලය දිය යුතු ඔටෝ ඩීසල් ප්‍රමාණය තීරණය කිරීමට බලධරයාට හැකිවීම පිණිස, බලධරයාට අවශ්‍ය විය හැකි තොරතුරු සපයන ලෙස බලධරයා විසින් ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකි ය.

(3) මේ පනත යටතේ ඔටෝ ඩීසල් පාරිභෝගිකයකු වශයෙන් (1) වන උපවගන්තිය ප්‍රකාර අනුමත කරනු ලැබ ඇතැයි සලකනු ලබන යම් තැනැත්තකුට ඔටෝ ඩීසල් පාරිභෝගිකයකු වශයෙන් අනුමතය සඳහා මේ පනත යටතේ ඉල්ලුම් කිරීමට නියම කරනු ලැබේ යයි මේ පනතෙහි වූ කිසිවක් තේරුම් ගැනීම හෝ අර්ථ නිරූපණය කිරීම හෝ නොකළ යුතු ය.

II වන කොටසේ ඇතැම් විධි විධාන අදාළ වීම.

21. ඔටෝ ඩීසල් පාරිභෝගිකයකු ලෙස අනුමත කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍ර, ඔටෝ ඩීසල් පාරිභෝගිකයකු ලෙස තැනැත්තකු අනුමත කිරීම ප්‍රතික්ෂේප කිරීමට බලධරයාට ඇති බලය, අනුමත ඔටෝ ඩීසල් පාරිභෝගිකයකුට බලපත්‍ර නිකුත් කිරීම, අනුමත ඔටෝ ඩීසල් පාරිභෝගිකයකු වෙත නිකුත් කරන ලද බලපත්‍ර විකිණීම සහ පැවරීම තහනම් කිරීම, ඔටෝ ඩීසල් පාරිභෝගිකයකු වශයෙන් අනුමත කිරීම ප්‍රත්‍යාදිෂ්ට කිරීම, ඔටෝ ඩීසල් විකිණීම සහ භාරදීම, සිල්ලර ගබඩාවල ඔටෝ ඩීසල් තොග අඩුවෙන් තිබීම හෝ වැඩියෙන් තිබීම, ඔටෝ ඩීසල් විකිණීමේදී විකුණුම්කරුවන් සතු කාර්ය, ඔටෝ ඩීසල් සිය සන්තකයෙහි තබාගෙන ඇති තැනැත්තන් විසින් සපයනු ලැබිය යුතු වාර වාර්තා, සංස්ථාව විසින් ඔටෝ ඩීසල් විකිණීම සීමා කිරීම සහ ඔටෝ ඩීසල් සන්තකව සිටීම සීමා කිරීම යන කරුණු සම්බන්ධයෙන් 5 වන, 6 වන, 7 වන, 8 වන, 9 වන, 10 වන, 11 වන, 12 වන, 13 වන, 14 වන සහ 15 වන වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

## V වන කොටස

### බර ඩීසල් විකිණීම යනාදිය පිළිබඳ සීමා කිරීම්

බර ඩීසල් මිලට ගැනීම පිළිබඳ සීමා කිරීම.

22. මේ පනතේ මේ කොටස ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයෙහි සිට සහ ඉන් පසුව, විකුණුම්කරුවකු නොවන කිසිම තැනැත්තකු විසින්, තමා බර ඩීසල් සම්බන්ධයෙන් අනුමත පාරිභෝගිකයකු ද බර ඩීසල් වෙනුවෙන් බලධරයා විසින් නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් දරන්නකු ද වන්නේ නම් මිස, බර ඩීසල් මිලට ගැනීම හෝ ලබා ගැනීම නොකළ යුතු ය.

II වන කොටසේ ඇතැම් විධිවිධාන අදාළ වීම.

23. බර ඩීසල් පාරිභෝගිකයකු ලෙස අනුමත කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍ර, බර ඩීසල් පාරිභෝගිකයකු ලෙස තැනැත්තකු අනුමත කිරීම ප්‍රතික්ෂේප කිරීමට බලධරයාට ඇති බලය, අනුමත බර ඩීසල් පාරිභෝගිකයකුට බලපත්‍ර නිකුත් කිරීම, අනුමත බර ඩීසල් පාරිභෝගිකයකු වෙත නිකුත් කරන ලද බලපත්‍ර විකිණීම සහ පැවරීම තහනම් කිරීම, බර ඩීසල් පාරිභෝගිකයකු වශයෙන් අනුමත කිරීම ප්‍රත්‍යාදිෂ්ට කිරීම, බර ඩීසල් විකිණීම සහ භාරදීම, සිල්ලර ගබඩාවල බර ඩීසල් තොග අඩුවෙන් තිබීම හෝ වැඩියෙන් තිබීම, බර ඩීසල් විකිණීමේ දී විකුණුම්කරුවන් සතු කාර්යය, බර ඩීසල් සිය සන්තකයෙහි තබාගෙන ඇති තැනැත්තන් විසින් සපයනු ලැබිය යුතු වාර වාර්තා, සංස්ථාව විසින් බර ඩීසල් විකිණීම

සීමා කිරීම සහ බර ඕසල් සන්තකව සිටීම සීමා කිරීම යන කරුණු සම්බන්ධයෙන් 5 වන, 6 වන, 7 වන, 8 වන, 9 වන, 10 වන, 11 වන, 12 වන, 13 වන, 14 වන සහ 15 වන වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

## VI වන කොටස

### උදුන් තෙල් විකිණීම යනාදිය පිළිබඳ සීමා කිරීම්

උදුන් තෙල් මිලට ගැනීම පිළිබඳ සීමා කිරීම.

24. මේ පනතේ මේ කොටස ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයෙහි සිට සහ ඉන් පසුව, විකුණුම්කරුවකු නොවන කිසිම තැනැත්තකු විසින්, තමා උදුන් තෙල් සම්බන්ධයෙන් අනුමත පාරිභෝගිකයකු ද උදුන් තෙල් වෙනුවෙන් බලධරයා විසින් නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් දරන්නකු ද වන්නේ නම් මිස, උදුන් තෙල් කිසිවක් මිලට ගැනීම හෝ ලබා ගැනීම නොකළ යුතු ය.

II වන කොටසේ ඇතැම් විධිවිධාන අදාළ වීම.

25. උදුන් තෙල් පාරිභෝගිකයකු ලෙස අනුමත කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍ර, උදුන් තෙල් පාරිභෝගිකයකු ලෙස තැනැත්තකු අනුමත කිරීම ප්‍රතික්ෂේප කිරීමට බලධරයාට ඇති බලය, අනුමත උදුන් තෙල් පාරිභෝගිකයකුට බලපත්‍ර නිකුත් කිරීම, අනුමත උදුන් තෙල් පාරිභෝගිකයකු වෙත නිකුත් කරන ලද බලපත්‍ර විකිණීම සහ පැවරීම තහනම් කිරීම, උදුන් තෙල් පාරිභෝගිකයකු වශයෙන් අනුමත කිරීම ප්‍රත්‍යාදිෂ්ට කිරීම, උදුන් තෙල් විකිණීම සහ භාරදීම, සිල්ලර ගබඩාවල උදුන්තෙල් තොග අඩුවෙන් තිබීම හෝ වැඩියෙන් තිබීම, උදුන්තෙල් විකිණීමේදී විකුණුම්කරුවන් සතු කාර්ය, උදුන් තෙල් සිය සන්තකයෙහි තබාගෙන ඇති තැනැත්තන් විසින් සපයනු ලැබිය යුතු වාර වාර්තා, සංස්ථාව විසින් උදුන්තෙල් විකිණීම සීමා කිරීම සහ උදුන්තෙල් සන්තකව සිටීම සීමා කිරීම යන කරුණු සම්බන්ධයෙන් 5 වන, 6 වන, 7 වන, 8 වන, 9 වන, 10 වන, 11 වන, 12 වන, 13 වන, 14 වන සහ 15 වන වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

## VII වන කොටස

### ද්‍රව ඛනිජ තෙල් වායු විකිණීම යනාදිය පිළිබඳ සීමා කිරීම

ද්‍රව ඛනිජ තෙල් වායු මිලට ගැනීම පිළිබඳ සීමා කිරීම.

26. මේ පනතේ මේ කොටස ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයෙහි සිට සහ ඉන් පසුව විකුණුම්කරුවකු නොවන කිසිම තැනැත්තකු විසින්, තමා ද්‍රව ඛනිජ තෙල් වායු සම්බන්ධයෙන් අනුමත පාරිභෝගිකයකු ද ද්‍රව ඛනිජ තෙල් වායු වෙනුවෙන් බලධරයා විසින් නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් දරන්නකු ද නම් මිස ද්‍රව ඛනිජ තෙල් වායු මිලට ගැනීම හෝ ලබා ගැනීම නොකළ යුතු ය.

II වන කොටසේ ඇතැම් විධිවිධාන අදාළ වීම.

27. ද්‍රව ඛනිජ තෙල් වායු පාරිභෝගිකයකු ලෙස අනුමත කිරීම සඳහා වූ ඉල්ලුම්පත්‍ර, ද්‍රව ඛනිජ තෙල් වායු පාරිභෝගිකයකු ලෙස තැනැත්තකු අනුමත කිරීම ප්‍රතික්ෂේප කිරීමට බලධරයාට ඇති බලය, අනුමත ද්‍රව ඛනිජ තෙල් වායු පාරිභෝගිකයකුට බලපත්‍ර නිකුත් කිරීම, අනුමත ද්‍රව ඛනිජ තෙල් වායු පාරිභෝගිකයකු වෙත

නිකුත් කරන ලද බලපත්‍ර විකිණීම සහ පැවරීම තහනම් කිරීම, ද්‍රව ඛනිජ තෙල් වායු පාරිභෝගිකයකු වශයෙන් අනුමත කිරීම ප්‍රත්‍යාදිෂ්ට කිරීම, ද්‍රව ඛනිජ තෙල් වායු විකිණීම සහ භාරදීම, සිල්ලර ගබඩාවල ද්‍රව ඛනිජ තෙල් වායු තොග අඩුවෙන් තිබීම හෝ වැඩියෙන් තිබීම, ද්‍රව ඛනිජ තෙල් වායු විකුණන විට විකුණුම්කරුවන් සතු කාර්ය, ද්‍රව ඛනිජ තෙල් වායු සිය සන්තකයෙහි තබාගෙන ඇති තැනැත්තන් විසින් සපයනු ලැබිය යුතු වාර වාර්තා සංස්ථාව විසින් ද්‍රව ඛනිජ තෙල් වායු විකිණීම සීමා කිරීම සහ ද්‍රව ඛනිජ තෙල් වායු සන්තකව සිටීම සීමා කිරීම යන කරුණු සම්බන්ධයෙන් 5 වන, 6 වන, 7 වන, 8 වන, 9 වන, 10 වන, 11 වන, 12 වන, 13 වන, 14 වන සහ 15 වන වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

## VIII වන කොටස

### ගුවන් යානා ටර්බයින් ඉන්ධන විකිණීම යනාදිය පිළිබඳ සීමාකිරීම්

ගුවන් යානා ටර්බයින් ඉන්ධන මිලට ගැනීම පිළිබඳ සීමා කිරීම.

28. මේ පනතේ මේ කොටස ක්‍රියාත්මක වීම ආරම්භ වූ දින යෙහි සිට සහ ඉන් පසුව, විකුණුම්කරුවකු නොවන කිසිම තැනැත්තකු විසින්, ඔහු ගුවන් යානා ටර්බයින් ඉන්ධන සම්බන්ධයෙන් අනුමත පාරිභෝගිකයකු ද ගුවන් යානා ටර්බයින් ඉන්ධන වෙනුවෙන් බලධරයා විසින් නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් දරන්නකු ද වන්නේ නම් මිස, ගුවන් යානා ටර්බයින් ඉන්ධන මිලට ගැනීම හෝ ලබා ගැනීම නොකළ යුතු ය.

II වන කොටසේ ඇතැම් විධිවිධාන අදාළ වීම.

29. ගුවන් යානා ටර්බයින් ඉන්ධන පාරිභෝගිකයකු ලෙස අනුමත කිරීම සඳහා වූ ඉල්ලුම්පත්‍ර, ගුවන් යානා ටර්බයින් ඉන්ධන පාරිභෝගිකයකු ලෙස තැනැත්තකු අනුමත කිරීම ප්‍රතික්ෂේප කිරීමට බලධරයාට ඇති බලය, අනුමත ගුවන් යානා ටර්බයින් ඉන්ධන පාරිභෝගිකයකුට බලපත්‍ර නිකුත් කිරීම, අනුමත ගුවන් යානා ටර්බයින් ඉන්ධන පාරිභෝගිකයකු වෙත නිකුත් කරන ලද බලපත්‍ර විකිණීම සහ පැවරීම තහනම් කිරීම, ගුවන් යානා ටර්බයින් ඉන්ධන පාරිභෝගිකයකු වශයෙන් අනුමත කිරීම ප්‍රත්‍යාදිෂ්ට කිරීම, ගුවන් යානා ටර්බයින් ඉන්ධන විකිණීම සහ භාරදීම, සිල්ලර ගබඩාවල ගුවන් යානා ටර්බයින් ඉන්ධන තොග අඩුවෙන් තිබීම හෝ වැඩියෙන් තිබීම, ගුවන් යානා ටර්බයින් ඉන්ධන විකුණන විට විකුණුම්කරුවන් සතු කාර්ය, ගුවන් යානා ටර්බයින් ඉන්ධන සිය සන්තකයෙහි තබාගෙන ඇති තැනැත්තන් විසින් සපයනු ලැබිය යුතු වාර වාර්තා, සංස්ථාව විසින් ගුවන්යානා ටර්බයින් ඉන්ධන විකිණීම සීමා කිරීම සහ ගුවන් යානා ටර්බයින් ඉන්ධන සන්තකව සිටීම සීමා කිරීම යන කරුණු සම්බන්ධයෙන් 5 වන, 6 වන, 7 වන, 8 වන, 9 වන, 10 වන, 11 වන, 12 වන, 13 වන, 14 වන සහ 15 වන වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

## IX වන කොටස

### පොදු විධිවිධාන

විකුණුම්කරුවන් සහ සැපයුම්කරුවන් විසින් සැපයිය යුතු වාර්තා යනාදිය.

30. (1) තමා සන්තකයෙහි ඇති කිසියම් ඛනිජ තෙල් නිෂ්පාදනයක ප්‍රමාණය සම්බන්ධයෙන් ද අනුමත පාරිභෝගිකයන්ට සහ වෙනත් තැනැත්තන්ට ඛනිජ තෙල් නිෂ්පාදන කිසිවක් විකිණීම නැතහොත් භාරදීම සම්බන්ධයෙන් ද ඒ විකිණීමේ හෝ භාර

දීමේ කාර්යය සඳහා තමා වෙත භාරදෙන තුපත් සම්බන්ධයෙන් ද කලින් කල බලධරයාට අවශ්‍ය වන වාර්තා සහ වෙනත් තොරතුරු සෑම විකුණුම්කරුවකු විසින් ම බලධරයා වෙත සැපයිය යුතු ය.

(2) සංස්ථාව විසින්—

(අ) මේ පනතේ මේ කොටස ක්‍රියාත්මකවීම ආරම්භ වූ දින සිට සති දෙකක කාලසීමාවක් ඉකුත්වීමට පෙර, සංස්ථාව විසින් ඛනිජ තෙල් නිෂ්පාදන කිසිවක් විකිණීමේ කාර්යය සඳහා විකුණනු ලැබූ හෝ භාර දෙනු ලැබූ සෑම විකුණුම් කරුවකුගේ නම සහ ඒ විකුණුම්කරු විසින් ඒ නිෂ්පාදනය විකුණනු ලබන ගබඩාවෙහි ලිපිනය දැක්වෙන ප්‍රකාශයක්, බලධරයා වෙත සැපයිය යුතු ය ;

(ආ) එය සන්තකයෙහි හෝ පාලනය යටතේ තිබෙන්නා වූ නැතහොත් ශ්‍රී ලංකාව වෙත ලැබෙනු ඇතැයි බලාපොරොත්තු වන්නා වූ කිසියම් ඛනිජ තෙල් නිෂ්පාදනයක තොගවලට ද විකුණුම්කරුවන්ට සහ වෙනත් තැනැත්තන්ට කිසියම් ඛනිජ තෙල් නිෂ්පාදනයක් විකිණීමට නැතහොත් භාරදීමට ද අදාළව කලින් කල බලධරයාට අවශ්‍ය වන වාර්තා සහ වෙනත් තොරතුරු බලධරයා වෙත සැපයිය යුතු ය.

විකුණුම්කරුවනට කරන සැපයීම් පාලනය කිරීමෙහි ලා බලධරයාට ඇති බලය.

31. බලධරයා විසින්—

(අ) ශ්‍රී ලංකාවෙහි ඇති කිසියම් ඛනිජ තෙල් නිෂ්පාදනයක තොග ;

(ආ) පොදු කාර්ය සඳහා සහ අත්‍යවශ්‍ය සේවා පවත්වා ගෙන යාම සඳහා ඒ තොග සංරක්ෂණය කිරීමේ අවශ්‍යතාව ;

(ඇ) ඒ නිෂ්පාදනය වෙනුවෙන් 12 වන වගන්තිය යටතේ නැතහොත් 18 වන වගන්තිය හෝ 21 වන වගන්තිය හෝ 23 වන වගන්තිය හෝ 25 වන වගන්තිය හෝ 27 වන වගන්තිය හෝ 29 වන වගන්තිය සමග කියවිය යුතු 12 වන වගන්තිය යටතේ ප්‍රේෂණය කරන ලද තුපත්

කෙරෙහි සැලකිලිමත්ව, විකුණුම්කරුවන් වෙත සැපයිය හැකි හෝ භාරදිය හැකි ඒ නිෂ්පාදනයෙහි ප්‍රමාණ සහ එම ප්‍රමාණ භාරදීම කළ හැකි වේලාවල් සම්බන්ධයෙන් සංස්ථාව වෙත විධාන නිකුත් කළ හැකි ය.

කූට ලෙස වෙනස් කරන ලද බල රහිත නැතහොත් අවලංගු කරන ලද තුපත් යනාදිය සන්තකයෙහි තබා ගැනීම.

32. (1) කූට ලෙස වෙනස් කරන ලද යම් තුපනයක් තම සන්තකයෙහි තබාගන්නා වූ හෝ කිසියම් ඛනිජ තෙල් නිෂ්පාදනයක් ලබා ගැනීමේ කාර්යය සඳහා කූට ලෙස වෙනස් කරන ලද යම් තුපනයක් ඉදිරිපත් කරන්නා වූ හෝ යම් තැනැත්තකු විසින්,—

(අ) බලධරයා විසින් හෝ බලධරයා වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් යම් නිලධරයකු නැතහොත් තැනැත්තකු විසින් හෝ බලධරයා වෙනුවෙන් ක්‍රියා කරන්නේ යයි කියනු ලබන සහ සාමාන්‍යයෙන් තමා වෙත බලපත්‍ර නිකුත් කරනු ලබන

ස්ථානයේ දී බලධරයා වෙනුවෙන් ක්‍රියා කර ඇති බවට සාධාරණ ව විශ්වාස කරනු ලබන යම් තැනැත්තකු විසින් හෝ තමා වෙත නිකුත් කරන ලද බලපත්‍රයකට ඒ කූපනය යා කර තිබුණ බව ; හෝ

(ආ) තමා අනුයෝජිතයකුව නැතහොත් සේවකයකුව සිටියේ වෙනත් යම් තැනැත්තකුගේ ද ඒ තැනැත්තා විසින්, ඒ තැනැත්තාගේ පාවිච්චිය සඳහා විකුණුම්කරුවකුගෙන් ඒ නිෂ්පාදනය ලබා ගැනීමට තමාට හැකි කරවීමේ කාර්ය සඳහා, ඒ කූපනය තමා වෙත බාර දෙන ලද බව ; හෝ

(ඇ) සිදු කරන ලදැයි කියනු ලබන වරද සිදු කරනු ලැබූ අවස්ථාවේ දී තමා විකුණුම්කරුවකු ව සිටි බවට සහ ඒ විකුණුම්කරුගේ සිල්ලර ගබඩාවක දී වෙනත් තැනැත්තකුට ඛනිජ තෙල් නිෂ්පාදනයක් විකිණීම හෝ භාරදීම සම්බන්ධයෙන් 10 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව නැතහොත් 18 වන වගන්තියේ හෝ 21 වන වගන්තියේ හෝ 23 වන වගන්තියේ හෝ 25 වන වගන්තියේ හෝ 27 වන වගන්තියේ හෝ 29 වන වගන්තිය සමග කියවිය යුතු 10 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව තමා විසින් බලපත්‍රයෙන් ඒ කූපනය වෙන් කර ගන්නා ලද බවට සහ ඒ කූපනය කූට ලෙස වෙනස් කරන ලද කූපනයක් යයි සාධාරණ ලෙස සැක කළ නොහැකි වූ බව ; හෝ

(ඈ) සිදු කරන ලදැයි කියනු ලබන වරද සිදු කරනු ලැබූ අවස්ථාවේ දී තමා සංස්ථාවෙහි අනුයෝජිතයකු ව නැතහොත් සේවකයකුව සිටි බව සහ—

(i) කූපනය, 12 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව නැතහොත් 18 වන වගන්තියේ හෝ 21 වන වගන්තියේ හෝ 23 වන වගන්තියේ හෝ 25 වන වගන්තියේ හෝ 27 වන වගන්තියේ හෝ 29 වන වගන්තිය සමග කියවිය යුතු 12 වන වගන්තියේ විධිවිධාන වලට අනුකූලව, විකුණුම්කරුවකු විසින් තමා වෙත එවන ලද බව ; හෝ

(ii) සංස්ථාවේ දී වෙනත් තැනැත්තකුට ඛනිජ තෙල් නිෂ්පාදනයක් විකුණනු ලැබූ විට නැතහොත් භාර දෙනු ලැබූ විට, 10 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව නැතහොත් 18 වන වගන්තියේ හෝ 21 වන වගන්තියේ හෝ 23 වන වගන්තියේ හෝ 25 වන වගන්තියේ හෝ 27 වන වගන්තියේ හෝ 29 වන වගන්තිය සමග කියවිය යුතු 10 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ඒ කූපනය තමා විසින් බලපත්‍රයකින් වෙන් කර ගන්නා ලද බව

අධිකරණය සෑහීමට පත් වන පරිදි ඔප්පු කරනු ලැබුව හොත් මිස, ඒ තැනැත්තා වරදක් සම්බන්ධයෙන් වරදකරු වන්නේ ය.

8—ඒ 40765 (79/04)

(2) (අ) කිසියම් ඛනිජ තෙල් නිෂ්පාදනයක් ලබා ගැනීමේ කාර්යය සඳහා සිල්ලර ගබඩාවක විකුණුම්කරුවකු වෙත ඉදිරිපත් කරන ලද කූපනයක් තම සන්තකයෙහි තබා ගන්නා හෝ කිසියම් ඛනිජ තෙල් නිෂ්පාදනයක් ලබා ගැනීමේ කාර්යය සඳහා යම් බලරහිත කූපනයක් ඉදිරිපත් කරන; නැතහොත්

(ආ) බලධරයාගේ විධානයක් මගින් හෝ විධානයක් යටතේ අවලංගු කරන ලද යම් කූපනයක් තම සන්තකයෙහි තබා ගන්නා හෝ කිසියම් ඛනිජ තෙල් නිෂ්පාදනයක් ලබා ගැනීමේ කාර්යය සඳහා ඒ කූපනය ඉදිරිපත් කරන

යම් තැනැත්තෙක් වරදක් සම්බන්ධයෙන් වරදකරු වන්නේ ය:

එසේ වුව ද—

(අ) සිදු කරන ලදැයි කියනු ලබන වරද සිදු කරනු ලැබූ අවස්ථාවේ දී තමා විකුණුම්කරුවකුව හෝ විකුණුම්කරුවකුගේ අනුයෝජිතයකුව නැතහොත් සේවකයකුව සිටි බවට සහ 10 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව නැතහොත් 18 වන වගන්තියේ හෝ 21 වන වගන්තියේ හෝ 23 වන වගන්තියේ හෝ 25 වන වගන්තියේ හෝ 27 වන වගන්තියේ හෝ 29 වන වගන්තිය සමග කියවිය යුතු 10 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව කූපනය බලපත්‍රයකින් වෙන් කර ගන්නා ලද බවට හා විකුණුම්කරුවකු, අනුයෝජිතයකු නැතහොත් සේවකයකු වශයෙන් වූ ස්වකීය තත්ත්වයෙන් එය තම සන්තකයෙහි තිබුණු බව; හෝ

(ආ) සිදු කරන ලදැයි කියනු ලබන වරද සිදු කරනු ලැබූ අවස්ථාවේ දී තමා සංස්ථාවේ අනුයෝජිතයකුව නැතහොත් සේවකයකුව සිටි බව සහ—

(i) කූපනය, 12 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව නැතහොත් 18 වන වගන්තියේ හෝ 21 වන වගන්තියේ හෝ 23 වන වගන්තියේ හෝ 25 වන වගන්තියේ හෝ 27 වන වගන්තියේ හෝ 29 වන වගන්තිය සමග කියවිය යුතු 12 වන වගන්තියේ හෝ විධිවිධානවලට අනුකූලව සංස්ථාව වෙත එවා ඇති බවට සහ අනුයෝජිතයකු නැතහොත් සේවකයකු වශයෙන් වූ ස්වකීය තත්ත්වයෙන් එය තම සන්තකයෙහි තිබුණු බව; හෝ

(ii) සංස්ථාවේ දී වෙනත් තැනැත්තකුට ඛනිජ තෙල් නිෂ්පාදනයක් විකුණනු ලැබූ විට නැතහොත් භාර දෙනු ලැබූ විට 10 වන වගන්තියේ විධිවිධාන වලට අනුකූලව නැතහොත් 18 වන වගන්තිය හෝ 21 වන වගන්තිය හෝ 23 වන වගන්තිය හෝ 25 වන වගන්තිය හෝ 27 වන

වගන්තිය හෝ 29 වන වගන්තිය සමග කියවිය යුතු 10 වන වගන්තියට අනුකූලව ඒ කූපනය තමා විසින් බලපත්‍රයකින් වෙන් කර ගන්නා ලද බව

යම් තැනැත්තකු විසින් අධිකරණය සෑහීමට පත් වන පරිදි ඔප්පු කරනු ලැබුවහොත්, මේ උපවගන්තියේ (අ) ඡේදයෙහි සඳහන් යම් කූපනයක් තම සන්තකයෙහි තබා ගැනීමේ හේතුව නිසා පමණක් එවැනි කිසිම තැනැත්තකු වරදක් සම්බන්ධයෙන් වරදකරු ලෙස සලකනු නොලැබිය යුතු ය.

කූපන් කූට ලෙස වෙනස් කිරීම සඳහා උපකරණ යනාදිය සන්තකයෙහි තබා ගැනීම.

33. (1) බලපත්‍ර හෝ කූපන් කූට ලෙස වෙනස් කිරීම සඳහා පාවිච්චි කරනු ලබන නැතහොත් පාවිච්චි කළ හැකි යම් තහඩුවක් හෝ මුද්‍රාවක් හෝ වෙනත් උපකරණයක් නැතහොත් ද්‍රව්‍යයක් සාදන හෝ ඒවායේ ව්‍යාජ අනුකරණ සාදන හෝ තම සන්තකයේ තබා ගන්නා හෝ යම් තැනැත්තෙක් වරදක් සම්බන්ධයෙන් වරද කරු වන්නේ ය.

(2) නීතිපතිවරයා විසින් හෝ නීතිපතිවරයාගේ අනුමතය ඇතිව හෝ හැර, (1) වන උපවගන්තිය යටතේ වූ වරදක් සම්බන්ධයෙන් නඩු පවරනු නොලැබිය යුතු ය.

කූට ලෙස වෙනස් කරන ලද කූපන් යනාදිය තහනමට ගැනීම.

34. (1) පොලිස් ස්ථානයක් භාර සැරයන්වරයකුගේ තත්ත්ව යට නොඅඩු තත්ත්වයක යම් පොලිස් නිලධරයකු විසින්, කූට ලෙස වෙනස් කරන ලද බලපත්‍ර හෝ කූට ලෙස වෙනස් කරන ලද කූපන් හෝ බවට විශ්වාස කිරීමට තමාට සාධාරණ හේතු ඇති යම් බලපත්‍ර හෝ කූපන් තහනමට ගැනීම නීත්‍යානුකූල විය යුතු ය.

(2) කූට ලෙස වෙනස් කරන ලද බලපත්‍ර හෝ කූට ලෙස වෙනස් කරන ලද කූපන් කිසිවක් නැතහොත් බලපත්‍ර හෝ කූපන් කූට ලෙස වෙනස් කිරීම සඳහා පාවිච්චි කරනු ලබන යම් උපකරණයක් හෝ ද්‍රව්‍ය යම් ස්ථානයක සඟවා ඇති බවට, තබා ඇති බවට හෝ තැන්පත් කර ඇති බවට පොලිස් අධිකාරිවරයකුගේ තත්ත්වයට නොඅඩු තත්ත්වයක යම් පොලිස් නිලධරයකුට සැක කිරීමට සාධාරණ හේතු තිබේ නම් සහ ඒ බලපත්‍ර, කූපන්, උපකරණ හෝ ද්‍රව්‍ය තහනමට ගැනීමේ කාර්යය සඳහා ඒ ස්ථානය සෝදිසි කිරීම යෝග්‍ය බවට ද අපරාධ නඩු විධානයට අදාළ නීතිය යටතේ සෝදිසි වරෙන්තුවක් සඳහා ඉල්ලුම් කිරීම, කාරණයේ හදිසි අවශ්‍යතාව හෝ වෙනත් මනා හේතුවක් නිසා කළ නොහැකි බවට ද ඒ පොලිස් නිලධරයා සෑහීමට පත් වන්නේ නම් තමා සැක කරන හේතු වාර්තා ගත කිරීමෙන් පසු ඒ පොලිස් නිලධරයා විසින්—

(අ) ඒ ස්ථානයට ඇතුල් වී සෝදිසි කර, එහි තිබී සම්භවන්නා වූ ද කූට ලෙස වෙනස් කරන ලද බලපත්‍ර නැතහොත් කූට ලෙස වෙනස් කරන ලද කූපන් බවට හෝ බලපත්‍ර හෝ කූපන් කූට ලෙස වෙනස් කිරීම සඳහා පාවිච්චි කරන බවට සාධාරණ ලෙස විශ්වාස කරනු ලබන්නා වූ ද බලපත්‍ර, කූපන්, උපකරණ හෝ ද්‍රව්‍ය කිසිවක් තහනමට ගනු ලැබිය හැකි ය ; නැතහොත්

(ආ) ලියවිල්ලකින් වූ නියමයක් මගින් මේ උපවගන්තියේ (අ) ඡේදයෙහි සඳහන් බලතල පාවිච්චි කරන ලෙස වෙනත් යම් පොලිස් නිලධරයකුට බලය දෙනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය යටතේ තහනමට ගන්නා ලද සියලු ලේඛන හෝ ද්‍රව්‍ය ඒ ද්‍රව්‍යවල ලැයිස්තුවක් ද සමග, ඒ තහනමට ගැනීම සිදුවූ ස්ථානය විෂයයෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණය ඉදිරියට නොපමාව ම ගෙන යායුතු අතර අධිකරණය විසින් ආඥාවක් මගින් විධාන කරනු ලබන යම් ආකාරයකට ඒ සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබිය යුතු ය.

විධාන කිරීමේ බලධරයාට ඇති බලය.

35. කිසියම් ඛනිජ තෙල් නිෂ්පාදනයක යම් පාරිභෝගිකයකු හෝ විකුණුම්කරුවකු ඒ නිෂ්පාදනය අපතේ යන ආකාරයට ගබඩා කරන නැතහොත් පාවිච්චි කරන බවට බලධරයා සෑහීමට පත්වන අවස්ථාවක, ඒ අපතේ යාම නැතහොත් පාවිච්චිය වැළැක්වීම, අත්හැරීම හෝ නතර කිරීම සඳහා අවශ්‍ය යයි බලධරයා සලකන විධාන ඒ පාරිභෝගිකයාට හෝ විකුණුම්කරුට බලධරයා විසින් දෙනු ලැබිය හැකි ය. එවැනි සෑම විධානයක් ම අනුව ක්‍රියා කිරීම ඒ පාරිභෝගිකයාගේ සහ විකුණුම්කරුගේ යුතුකම විය යුතු ය.

සංස්ථාව විසින් නිකුත් කරන ලද සහතිකයක ඇතුළත් ඇතැම් කරුණු සම්බන්ධයෙන් ඒ සහතිකය තීරණාත්මක සාක්ෂිය විය යුතු බව.

36. මේ පනත යටතේ පවරන ලද යම් නඩුවක දී, යම් ද්‍රව්‍යයක් හෝ වායුවක් ඛනිජ තෙල් නිෂ්පාදනයක් ද යන වග පිළිබඳව හෝ යම් ඛනිජ තෙල් නිෂ්පාදනයක් අයත් වන වර්ගය පිළිබඳව හෝ යම් ප්‍රශ්නයක් පැන නැගෙන අවස්ථාවක, ඒ ද්‍රව්‍ය හෝ වායුව ඛනිජ තෙල් නිෂ්පාදනයක් බවට වූ හෝ ඒ ඛනිජ තෙල් නිෂ්පාදනය අයත් වන්නේ කුමන වර්ගයකට ද යන්න වෙන් කර දක්වන හෝ සහතිකයක්, ඒ සහතිකය සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයාගේ හෝ ඒ සභාපතිවරයා විසින් ඒ සඳහා බලය දෙන ලද යම් තැනැත්තකුගේ අත්සන යටතේ නිකුත් කරන ලදැයි සලකනු ලැබේ ද එහි සඳහන් කර ඇති කරුණු පිළිබඳව තීරණාත්මක සාක්ෂිය ලෙස ඒ සහතිකය සාක්ෂ්‍යයේ දී පිළිගනු ලැබිය යුතු ය.

වැරදි සහ දණ්ඩන.

37. (1) මේ පනතේ විධිවිධාන කිසිවක් කඩ කරමින් ක්‍රියා කරන යම් තැනැත්තෙක් වරදක් සම්බන්ධයෙන් වරදකරු වන්නේ ය.

(2) (3) වන උපවගන්තියෙහි හෝ (4) වන උපවගන්තියෙහි හෝ (5) වන උපවගන්තියෙහි හෝ සඳහන් වරදක් නොවන මේ පනත යටතේ වූ වරදකට වරදකරු වන සෑම තැනැත්තකු ම මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙදහස් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

(3) (අ) මේ පනතේ යම් විධිවිධානයක් යටතේ ක්‍රියා කරන බලධරයාට හෝ යම් ඛනිජ තෙල් පාලකවරයකුට, නියෝජ්‍ය හෝ සහකාර ඛනිජ තෙල් පාලකවරයකුට හෝ යම් බලයලත් නිලධරයකුට ප්‍රතිරෝධය පාන නැත හොත් අවහිර කරන ; හෝ

(ආ) තමා විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතු ලෙස මේ පනතින් හෝ මේ පනත යටතේ හෝ නියම කරන ලද යම් වාර වාර්තාවක් ඉදිරිපත් කිරීම පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන හෝ එවැනි යම් වාර වාර්තාවක ලා හෝ මේ පනත යටතේ ඉදිරිපත් කරනු ලබන යම් ඉල්ලීමක ලා තමාගේ දැනීම අනුව අසත්‍ය හෝ සාවද්‍ය හෝ යම් සටහනක් හෝ ප්‍රකාශයක් කරන ; හෝ

(ඇ) බලපත්‍රයක් යටතේ මිලට ගැනීමට හෝ ලබාගැනීමට ඇති ඛනිජ තෙල් නිෂ්පාදනය යම් නිශ්චිත කාර්යයක් සඳහා අවශ්‍ය බවට කරුණු දැක්වීමෙන් බලපත්‍රයක් ලබාගෙන ඒ නිෂ්පාදනය වෙනත් යම් කාර්යයක් සඳහා යොදවන ; හෝ

(ඈ) මේ පනතේ යම් විධිවිධාන යටතේ ක්‍රියා කරමින් බලධරයා විසින් නිකුත් කරන ලද යම් විධානයක් අනුව ක්‍රියා කිරීම පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන

යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර මහෙස්ත්‍රාත් වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට හෝ එක් අවුරුද්දක් නොඉක්මවන කාලයකට දෙයාකාර යකින් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

(4) මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ මේ පනත යටතේ නිකුත් කරන ලද යම් බලපත්‍රයක නියම හෝ කඩ කරමින් ක්‍රියා කරන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූවිට රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය.

(5) (අ) යම් සිල්ලර ගබඩාවක තබා ඇති හෝ පවත්වා ගෙන යනු ලබන යම් මැනීමේ උපකරණයක් 15 වන වගන්තිය යටතේ නැතහොත් 18 වන වගන්තිය හෝ 21 වන වගන්තිය හෝ 23 වන

වගන්තිය හෝ 25 වන වගන්තිය හෝ 27 වන වගන්තිය හෝ 29 වන වගන්තිය සමඟ කියා විය යුතු 15 වන වගන්තිය යටතේ පරීක්ෂා කරනු ලැබීමේ දී නැතහොත් අත්හද බලනු ලැබීමේ දී යම් විටක වැරදි බවට පෙනී යන අවස්ථාවක, තත් කාලයෙහි ඒ සිල්ලර ගබඩාව භාරව සිටින තැනැත්තා වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගය කින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයක් නොඉක්ම වන දඩයකට හෝ තුන් මාසයක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

(ආ) නියෝග මගින් නියම කරනු ලැබිය හැකි වැරදි පිළිබඳ සීමා අනුලත මැනීමේ උපකරණයක් සැපයීම නිවැරදි ලෙස නොකරයි නම්, (අ) ඡේදයෙහි කාර්යයන් සඳහා එය වැරදි මැනීමේ උපකරණයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

පුද්ගල මණ්ඩල විසින් සිදු කරනු ලබන වැරදි.

38. මේ පනත යටතේ වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලබන අවස්ථාවක—

(අ) ඒ මණ්ඩලය සංස්ථාගත මණ්ඩලයක් නම්, වරද සිදු කරන ලද වේලාවේ දී ඒ මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු ව, ලේකම්වරයකු ව නැතහොත් වෙනත් සමාන නිලධරයකු ව සිටි සෑම තැනැත්තකු ම ; හෝ

(ආ) ඒ මණ්ඩලය සංස්ථාගත මණ්ඩලයක් නොවේ නම්, වරද සිදු කරන ලද වේලාවේ දී ඒ මණ්ඩලයේ සාමාජිකයකුව සිටි සෑම තැනැත්තකු ම

තමාගේ එකඟත්වය හෝ වංක සහයෝගය නොමැතිව ඒ වරද සිදු කර ඇති බවත් ස්වකීය කර්තව්‍යයන්හි ස්වභාවය සහ සියලු අවස්ථාගත කරුණු ගැන සැලකිලිමත් ව ඒ වරද සිදු කිරීම වැළැක්වීම පිණිස තමා විසින් ක්‍රියා කළ යුතුව තිබුණු පරිදි නිසි සියලු උදෙහ්ගයෙන් ක්‍රියා කළ බවත් ඔප්පු කරනු ලැබුවහොත් මිස ඒ අධ්‍යක්ෂවරයා, ලේකම්වරයා, වෙනත් සමාන නිලධරයා නැතහොත් සාමාජිකයා ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය.

සංස්ථාවට හෝ විකුණුම්කරුවන්ට විරුද්ධව වූ නඩු පිළිබඳ සීමා කිරීම.

39. සංස්ථාව විසින් හෝ විකුණුම්කරුවකු විසින්, අවස්ථාවෝචිත පරිදි, යම් ක්‍රියාවක් කරන ලද්දේ හෝ නොකර හරින ලද්දේ මේ පනතේ විධිවිධාන අතුරින් යම් විධිවිධානයක් අනුව ක්‍රියා කිරීමේ කාර්යය සඳහා නම්, සංස්ථාව විසින් හෝ විකුණුම්කරුවකු විසින් කරන ලද හෝ නොකර හරින ලද ඒ ක්‍රියාව සම්බන්ධයෙන් සංස්ථාවට හෝ ඒ විකුණුම්කරුට හෝ විරුද්ධව කිසිම සිවිල් නඩුවක් පැවරීම හෝ පවත්වා ගෙන යාම නොකළ යුතු ය.

නියෝග.

40. (1) මේ පනතේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ හා විධිවිධාන බල ගැන්වීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) නියම කළ යුතු ලෙස මේ පනතෙහි සඳහන් හෝ මේ පනතින් නියමිත සියලු කාරණා සඳහා හෝ සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් විශේෂයෙන් හා (1) වන උපවගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව නියෝග සාදනු ලැබිය හැකි ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කරනු ලබන දින යෙහි හෝ නියෝගයෙහි සඳහන් කරනු ලබන යම් පසු දිනයක හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක් ම එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක්, එය යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොවන පරිදි, එහි අනනුමත යේ දින සිට අවලංගු කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුත්තේ යම් දිනයක සිට ද ඒ දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

**41.** මේ පනතේ විධිවිධාන යම් ඛනිජ තෙල් නිෂ්පාදනයක පාරිභෝගිකයකුගේ තත්ත්වයෙන් ආණ්ඩුව සම්බන්ධයෙන් ද අදාළ විය යුතු ය. පනත ආණ්ඩුව සම්බන්ධයෙන් අදාළ වීම.

**42.** පෙට්රල් (සැපයුම් පාලනය කිරීමේ) ආඥාපනත මෙයින් ඉවත් කරනු ලැබේ. 174 වන අධිකාරය ඉවත් කිරීම.

**43.** වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වී තිබුණ ද, මේ පනතේ විධිවිධාන බල පැවැත්විය යුතු අතර ඒ අනුව, මේ පනතේ විධිවිධාන සහ ඒ වෙනත් නීතියේ විධිවිධාන අතර යම් ගැටීමක් හෝ නොගැළපීමක් ඇති වූ විටක, මේ පනතේ විධිවිධාන එකී වෙනත් පනතේ විධිවිධාන අභිභවා බල පැවැත්විය යුතු ය. මේ පනත වෙනත් ලිඛිත නීති අභිභවා බලපැවැත්විය යුතු බව.

**44.** (1) පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි— අර්ථ නිරූපණය.

"ගුවන් යානය" යන්නට හෙලිකොප්ටරයක් ද ඇතුළත් වේ ;

"අනුමත පාරිභෝගිකයා" යන්නෙන්, කිසියම් ඛනිජ තෙල් නිෂ්පාදනයක පාරිභෝගිකයකු ලෙස මේ පනත යටතේ අනුමත කරන ලද හෝ අනුමත කරන ලදැයි සලකනු ලබන යම් තැනැත්තෙක් අදහස් වේ ;

"බලයලත් නිලධරයා" යන්නෙන්, පරීක්ෂකවරයකුගේ තත්ත්වයට නොඅඩු තත්ත්වයක යම් පොලිස් නිලධරයකු අදහස් වන අතර බලධරයාගේ ලිඛිත බලය යටතේ ක්‍රියා කරන වෙනත් යම් තැනැත්තකු ද ඊට ඇතුළත් වේ ;

"සංස්ථාව" යන්නෙන්, 1961 අංක 28 දරන පනත යටතේ පිහිටුවන ලද ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව අදහස් වේ;

"මෝටර් වාහනය" යන්නෙන්, මෝටර් වාහන පනතෙහි අර්ථ කථනය කර ඇති පරිදි වූ මෝටර් වාහනයක් අදහස් වේ;

"මැනීමේ උපකරණය" යන්නට, කිසියම් ඛනිජ තෙල් නිෂ්පාදනයක් මැනීම සඳහා පාවිච්චි කරනු ලබන හෝ පවත්වාගෙන යනු ලබන යම් භාජනයක්, පොම්පයක් හෝ වෙනත් උපක්‍රමයක් ඇතුළත් වේ;

"බලපත්‍රය" යන්නෙන්, මේ පනත යටතේ බලධරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් අදහස් වේ;

"ඛනිජ තෙල් නිෂ්පාදනය" යන්නෙන්, පෙට්රල්, භූමිතෙල්, ඔටෝ ඩීසල්, බර ඩීසල්, උඳුන් තෙල්, ද්‍රව ඛනිජ තෙල් වායු හෝ ගුවන් යානා ටර්බයින් ඉන්ධන අදහස් වේ;

"පිරියත හෝ යන්ත්‍ර" යන්නට, ආලෝක කිරීමේ හෝ ආහාර පිසීමේ කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන යම් පහනක්, උදුනක් හෝ වෙනත් උපක්‍රමයක් ඇතුළත් වේ;

"නියෝගය" යන්නෙන්, අමාත්‍යවරයා විසින් 40 වන වගන්තිය යටතේ සාදන ලද නියෝගයක් අදහස් වේ;

"සිල්ලර ගබඩාව" යන්නෙන්, සේවා හෝ පිරවුම් ස්ථානයක් අදහස් වන අතර, විකුණුම්කරුවකු විසින් කිසියම් ඛනිජ තෙල් නිෂ්පාදනයක් විකුණනු ලබන වෙනත් යම් ස්ථානයක් ද ඊට ඇතුළත් වේ;

"විකුණුම්කරු" යන්නෙන්, සිල්ලරට විකිණීමේ කාර්යය සඳහා සංස්ථාව විසින් හෝ සංස්ථාවේ බලයලත් වෙළෙන්දකු විසින් හෝ කිසියම් ඛනිජ තෙල් නිෂ්පාදනයක් විකුණනු ලැබුවේ හෝ භාර දෙනු ලැබුවේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා අදහස් වේ;

(2) යම් බලපත්‍රයක්—

(අ) ඒ බලපත්‍රය නිකුත් කරනු ලැබූ විට ඒ බලපත්‍රයට යා කර තිබුණු යම් කූපනයක් ඒ බලපත්‍රය නිකුත් කරනු ලැබුවේ යම් ඛනිජ තෙල් නිෂ්පාදනයක් සම්බන්ධයෙන් ද ඒ ඛනිජ තෙල් නිෂ්පාදනය මිලයට ගැනීමේ හෝ ලබා ගැනීමේ කාර්යය සඳහා භාර නොදී තිබුණි නම්; සහ

(ආ) ඒ බලපත්‍රය නිකුත් කරනු ලැබුවේ යම් කාලසීමාවක් වෙනුවෙන් ද ඒ කාලසීමාව ඉකුත් වී නොමැති නම්

මේ පනතේ කාර්ය සඳහා වලංගු බලපත්‍රයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) යම් කූපනයක්—

(අ) එය වලංගු බලපත්‍රයකට යාකර ඇත් නම්;

(ආ) බලපත්‍රය නිකුත් කරනු ලැබුවේ යම් ඛනිජ තෙල් නිෂ්පාදන යක් වෙනුවෙන් ද ඒ ඛනිජ තෙල් නිෂ්පාදනය මිල දී ගැනීමේ හෝ ලබා ගැනීමේ කාර්යය සඳහා ඒ කූපනය ඉදිරිපත් කර නොමැති නම්; සහ

(ඇ) ඒ කූපනය නිකුත් කරනු ලැබුවේ යම් කාලසීමාවක් වෙනු වෙන් ද ඒ කාලසීමාව ඉකුත් වී නොමැති නම්

මේ පනතේ කාර්යය සඳහා වලංගු කූපනයක් ලෙස සලකනු ලැබිය යුතු ය.